
ලංකාවිත්ති
LANKA VITHTHI

LANKA VITHTHI
P.O.BOX 14373
LONDON NW6 3WU
ENGLAND

*Phone & Fax* : **020 7428 9388**
E-mail : **lanka.viththi @ virgin.net**

කර්තෘ : දයා ආනන්ද රණසිංහ
***Editor*** : **Daya Ananda Ranasinghe**

චිත්‍ර : චන්දන සෙනෙවිරත්න
***Art*** : Chandana Seneviratna
පරිගණක කටයුතු : චන්න කබ්රාල්
***Computer Graphics*** : Channa Cabraal
ඡායාරූප : ආනන්ද කාරියවසම්
***Photography*** : Ananda Kariyawasam



## අපි බේරුණු බේරිල්ලක්....!

දෙමළ කොටි ත්‍රස්තවාදීන්ගේ සැබෑ අරමුණ කවදා හෝ ලංකාවේ වෙනම දෙමළ රාජ්‍යයක් තනාගැනීමය. එය හැංගි හොරා කියන කරන දෙයක් නොවේ. එය පටන් ගත් දිනේ සිට අද වන තුරා උන් එක එල්ලේම කටයුතු කරන අරමුණකි. එසේම උන් ඒ බව මුලු ලෝකයටම ව්‍යංගෙන් නොව හොඳට කටඇර කියා ඇත. තම අරමුණ කුමක්දැයි උන්ට මොහොතකටවත් අමතක නොවේ. උදේ පාන්දර නැගිට උන් ඇනවිල්ලක් අරින්නේ ද ඊළම් කියාගෙන ය. රෑට නින්දට යනතුරාද නිදාගන්නේ නැතුව දිගටම ඇහැ ඇරගෙන සිටින උන්ද දවල් හීන දකිමින් මහන්සිවෙන්නේද ඊළම දිහාවට යන පාරක් කපාගන්නටය. මේ බව අමතකව ගොස් ඇත්තේ දෙමළ අයට නොව බහුතර සිහළයින්ට හා සිංහළ දේශපාලකයන්ට ය. ඔවුන් දුරදිග කල්පනා කරන අය නොවේ. එදා දවස ගැන පමණක් හිතන පිරිසකි. එසේම අනාවැකි කියන්නටද දක්ෂය. 'මොන පිස්සුද? ඕව කොහේද වෙන්නේ? ඊළම්? බම්බුව තමයි හම්බ වෙන්නෙ! මොන විකාරද? කවදාවත් හම්බවෙන ඊළමක්ද? තමුසෙලා නිකාම් බය වෙලා ඉන්නෙ. බයනැතුව ඉන්නවා ඕයි!' ඔවැනි කියුම්ය. ඔවුන්ගේ සිතුවිල්ලට අනුව ප්‍රභාකරන් විනාසකර දැමූ විට ඊළම් කතාවද, ත්‍රස්තවාද යද එතනින්ම අවසාන ය.

සිංහලයින් ද, සිංහළ දේශපාලකයින් ද එසේ පුච්චම් කතා කියද්දී කොටි ත්‍රස්තවාදීහු යුද්ධය දිගට යන අතරතුරේ ඊළම ගතහැකි වෙනත් මාර්ගයක් ගැන සොයා බැලූහ.

එනම් ජාත්‍යන්තර වශයෙන් යමක් කළ හැකිද යන්නයි. එක්සත් ජාතීන් සිටී. නැටෝ සිටී. ඇමරිකාව සිටී. යුරෝපා සංගමය සිටී. ඇන්ටන් බාලා උපක්‍රමයක් තැනීය. කොටි ඒ අනුව තිතට වැඩකළෝය. එනම් වෙනම රටක් ඉල්ලන්නට අවශ්‍ය මූලික සුදුසුකම් ලැබීමය.


තමන්ට ත්‍රිවිධ හමුදාවක් ඇත්නම්, පොලිසියක් ඇත්නම්, තමන්ගේ පාලනය පවතින බල ප්‍රදේශයක් ඇත්නම්, අයබදු එකතු කෙරේ නම් මහ රජය සමග ගිවිසුමකට එළඹී අවුරුදු පහක් සිටියේ නම් වෙනම රාජ්‍යයක් ඉල්ලා සිටීමට හැකි යයි මතයක් ඇත.

කොටි සංවිධානය ඒ සියල්ල ලෑස්තිකර ගත්තේ ය. නෝර්වේ උදව්වෙන් එවක රනිල් වික්‍රමසිංහ රජය සමග සටන් විරාම ගිවිසුමක් ද ගසාගත්තේ ය. ඉදිරියට විය හැකි විපාක ගැන සිංහළයින්ට මොළේට ආවේම නැත.

ගිවිසුමට අවුරුදු පහ පිරෙන්නේ ගිය පෙබරවාරි මාසයටය. ඒමාසය පැන්නුවේ නම් කොටින්ට ස්වයංරාජ්‍යයකට පදනම වැටෙන්නට තිබිණ. පෙබරවාරියට පෙර ගිවිසුමෙන් අයින් වෙන්නයයි දිගටම කෑගැහුවේ ජනතා විමුක්ති පෙරමුණය. ඒ වෙනුවෙන් අප ඔවුන්ට ප්‍රශංසා කළ යුතුය. වාසනාවට වර්තමාන රජය බලයට පත්විණ. රජය සටන්විරාම ගිවිසුමෙන් ඉවත්විය. කොටි ලෑස්ති කරගෙන ආ පැලෑන නුලෙන් ගහලා ගියේය. දැන් බලන් ඉන්නේ කොසෝවා දිහාය. කොසෝවා වෙනම රටක් වුණා නම් ඊළම ඉතා ළඟ යයි කොටි කියති. සිංහළයින් දැන්වත් පරෙස්සම් නුනොත් ආයිත් කතා කරන්නට දෙයක් ඉතුරු වන්නේ නැත.

# මහා ධාන්‍ය නෙලන මැදින් මහ

නිරුක්ති අර්ථය අනුව මහ කන්නයේ අස්වැන්න යන අරුත දෙන මැදින් යන වචනය හැදිල තියෙන්නෙ මහා ධාන්‍ය යන යෙදුම ඓතිහාසික වාග් විද්‍යා න්‍යායක් අනුව පරිණාමයට පත්වීමෙන්. මහා දින් වී, එය පසුව මාදින් වී, අන්තිමට මැදින් වෙලයි. සංස්කෘතයේ එන මාධ්‍ය යන්න සිංහලයේදී මැද වෙන්නෙ මාදින් යන්න මැදින් වෙනව වගේ. මහ කන්නයේ එදා ධාන්‍ය නමැති අස්වැන්න නෙලන්නෙ මේ මැදින් මහේදියි.



දීඝ නිකායෙ එන සාමඤ්ඤ ඵල සූත්‍රය අනුව මනුෂ්‍ය ආත්මයකට නෙලාගත හැකි අගනාම ඵලය නොහොත් මහා ම ධාන්‍ය වන්නේ අරහත් ඵලය නමැති සමණ ඵලයයි. සමාණානංච දස්සනං යනුවෙන් මහා මංගල සූත්‍රයේදි කියවෙන්නෙ මේ සමණ ඵලය අත්දකින්නට ලැබීම උතුම් මංගල කාරණයක් බවයි.

සමනය කියන වචනය හැදෙන්නෙ සම සහනය කියන වචන දෙක එක්වෙලයි. ශරීර සෞඛ්‍යයට හේතුවන්නෙ වා, පිත්, සෙම් යන තුන්දොස් සමනය වීමයි. මානසික සෞඛ්‍යයට හේතුවන්නෙ ලොභ, ද්වේශ, මෝහ යන අකුශල මුල් තුන සමනය වීමයි.

නවීන විද්‍යාව අනුව පොසිටිව් කියන ධන ශක්තියත්, නෙගටිව් කියන ඍණ ශක්තියත් සමනයවෙලා එම ප්‍රතිවිරුද්ධ ශක්ති දෙක අන්‍යොන්‍ය බල පෑමෙන් ශුන්‍යවෙලයි නියුට්‍රල් කියන උපේක්ෂා සහගත ශක්තිය හැදෙන්නෙ.

බෞද්ධ විද්‍යාව අනුව ලොභය ධනාත්මක ශක්තියක්. ද්වේශය ඍණාත්මක ශක්තියක්. උපේක්ෂාවයි කියන්නෙ ලෝභයයි කියන කැමැත්තෙනුත්, ද්වේශයයි කියන අකමැත්තෙනුත් තොර මධ්‍යස්ථභාවයකට සිත පත්වීමයි. සිතක් සමනය වෙනව කියන්නෙ මෙයටයි.

බුද්ධත්වයේදී බුදු සිත සමනය වුණේ රාගය කියන කැමැත්තත්, ද්වේශය කියන අකමැත්තත් මුළුමනින් ම නැතිවෙලයි. මෙම මධ්‍යස්ථ චිත්ත ස්වභාවය නමැති උපේක්ෂාව උන්වහන්සේගේ දුෂ්කරක්‍රියාවලින් නෙළාගත් මහා ධාන්‍ය නමැති අස්වැන්නයි. අරහත් ඵලය කියන්නෙ ඒ අස්වැන්නටයි.

බුදුන්වහන්සේ බුද්ධත්වයේදී නෙළාගත් මහා අස්වැන්න තම ඥාතීන් වන ශාක්‍යයන්ට බෙදාදීම සඳහා රජගහනුවර සිට කිඹුල්වත් පුරයට වැඩමකරන ඓතිහාසික ගමන ආරම්භවූයේ ස්වභාව ධර්මයේ අසිරිමත් අස්වැන්න සියළුම ගස්වැල්වලින් නෙළාගත හැකිවන පරිදි එළි දකින මැදින් මාසයේ පුරපසළොස්වක පොහෝ දිනකයි.

වසන්ත සමය උත්තරාර්ධ ගෝලයෙහි ආරම්භ වන්නේ ඉංග්‍රීසි මාර්තු මාසයේදී එළඹෙන සිංහල මැදින් මාසයේදීයි. ඒ ස්වභාව සෞන්දර්යයේ අග්‍රම ඵල භුක්ති විඳිය හැක්කේ අරහත් ඵලයෙන් සමනය වූ සිතක් ඇත්තෙකුට පමණයි. මහා පරිනිබ්බාන සූත්‍රයේ සඳහන් වන පරිදි රමණීයං ආනන්ද වෙසාලී යනාදී වශයෙන් පිරිනිවන් මංචකය කරා වඩිනා අතර උන්වහන්සේ පසු කළ ස්ථාන ගණනාවකම සොබා සෞන්දර්‍යයේ රමණීයත්වය ආනන්ද හිමියන්ට ප්‍රකාශ කරමින් වැඩම කළේ රහත් සිතකින් මතුවන අස්වැන්න රහත් නොවූ ආන්ද හිමියන්ට බෙදාදෙමිනුයි.

කෙලෙසුන් රහිත සිතකින් නෙළාගත හැකි මැදින් නමැති මහා ධාන්‍ය සම්පත නිවන් සුවයයි. පරම දේවත්වය යනු සත්චිත් ආනන්ද යනුවෙන් හින්දු සමයෙහි කියවෙන්නේ සත්පුරුෂ සිතකින් මතුවන ආනන්දය මාදින් නොහොත් මැදින් යයි කිවහැකි මහා ධාන්‍ය අස්වැන්නක් බවයි.

♦ ***සම්මානිත මහාචාර්‍ය ටි. එස්. අබේවික්‍රම*** **Harrow UK**

# *The Scull* හිස්කබල
## ( A tale from the West Africa )



**A** hunter came upon a huge tree with a whitened skull at its base. The skull spoke and said :

" beyond a certain hill is a field of calabashes. Take them to your hungry village, but do not tell anyone how you obtained them."

" How did you come to be here? " asked the hunter.

" My mouth killed me ", said the skull.

The hunter returned to the village with the calabashes and immediately told everyone. "A talking skull showed me a field of food!"

The Chief called him a liar.

"Then come with me! I'll prove what I say is true."

When they arrived at the tree, the hunter spoke to the skull but it remained silent. The hunter was put to death on the spot for lying.

In time, two whitened skulls sat beneath the tree. The first turned to the second and said : " See, in death we meet again, my kin. It's true a mouth can do you in !"

දඩයක්කාරයෙක් කැලයේ විශාල ගසක් මුල තිබුණු මිනිස් හිස්කබලක් දුටුවේය. ළඟට ගිය විට හිස්කබල කතා කර මෙසේ කීවේය.

" අර කන්දෙන් එහා පැත්තෙ කැමට සුදුසු ඉරිඟු කරල් වගයක් වැවෙනවා....... ඒවා කඩාගෙන ගිහින් උඹලගෙ ගමේ බඩගින්නෙ ඉන්න මිනිස්සුන්ට දීපන්....... හැබැයි මම කී බවක් කාටවත් කියන්න එපා......."

" මැරුණෙ මක්වෙලාද..?" දඩයක්කරු ඇසීය
" කට හින්දයි මම මැරුණෙ " හිස්කබල කීය.

දඩයක්කරු ගමට ගොස් ගමේ ප්‍රධානියා ඇතුළු සැමට සියල්ල විස්තර කළේය. ගමේ ප්‍රධානියා බොරුකාරයායයි ඔහුට බැණ වැදුණේය.

" එහෙනම් යං මාත් එක්ක ඒ ගහ ළඟට මම ඔප්පුකරල පෙන්නන්නම්...."දඩයක්කරු කීවේය.

පිරිස සමග ගහ ළඟට පැමිණි දඩයක්කරු හිස් කබලට කතා කළේය. එහෙත් හිස් කබල කතා කළේ නැත. එවෙලේම බොරුකීමේ වරදට නායකයා විසින් දඩයක්කරු මරාදමන ලදී.

කලකට පසු ඒ ගහයට සුදුපැහැ ගැහුණු හිස්කබල් දෙකක් වීය. එක් හිස් කබලක් අනෙකාට කතා කර මෙසේ කීය.

" යාළුවා එහෙනම් අන්තිමට මරණයේදී අපි දෙන්න ආයි මූණ ගැහුණා නේද? ඒක ඇත්ත කටකට පුළුවන් කෙනෙක්ව මරන්න! "

♦ ***කේ. කිරින්දගොඩ*** **London W5**

## ✻ නව සහශ්‍රයට ධර්මානුශාසනා ✻

### *හිතොපදේශයෙන්*

**බාලාදපි ග්‍රහීතව්‍යං - යුක්තමුකහං මනීෂිභි:**
**රවෙරවිෂයෙ කිං න ප්‍රදීපස්‍ය ප්‍රකාශනම්**

***අර්ථය*** : *කියන ලද යුක්ති සහගත වචනය බාලයෙකු කෙරෙන් වුවත් නුවණැත්තන් විසින් පිළිගනු ලැබිය යුතුය. හිරුගේ රැස් නොවැටෙන ස්ථාන යෙහි පහන ආලෝකය නොකරේද?*

අවවාද පිළිපදින්නා තම කාර්‍ය සිද්ධිය සලසාගන්නා බවත් අවවාද නොපිළිගන්නා විපතෙහි වැටෙන ආකාරයත් විස්තරකිරීම සඳහා මෙම පද්‍යය තෝරාගෙන ඇත. ලොකු කුඩා වුවත් සමාජයේ කොයි තරාතිරමක සිටියද කෙනෙකු තවත් කෙනෙකුගේ හෝ පිරිසකගේ සුබසිද්ධිය පිණිස යම් උපදේශයක් දෙනු ලබන්නේ බුද්ධිමතෙකු නම් එය පිළිපැදිය යුතුය. එය පිළිපැදීමෙන් තමන්ට යහපතක් වනවා මිස තමාගේ තරාතිරමට හානියක් වන්නේ නැත.

නමුත් මානාධික පුද්ගලයන්ගේ ස්වභාවය ඊට වෙනස්ය. තමාට වඩා අඩුවෙන් මිළ මුදල් දැන උගත්කම් පමණක් නොව වයසින්ද අඩු කෙනෙකු විසින් දෙනු ලබන අවවාදයකට උපදේශයකට කෙසේවත් කන් යොමුකිරීමට කැමති නැත.

මිනිසාගේ සියළු යහපතට හේතුවන ප්‍රධාන කරුණ අවවාදයයි. එය ගෙදරදී නම් තම දෙමාපිය වැඩිහිටියන් ගෙන්ද, පාසැලේදී ආචාර්‍යවරුන්ගෙන්ද, සමාජයේ දැන උගත් අයගෙන්ද ලබාගතහැකිය. සර්ව සම්පූර්ණ නොවන නිසා හැම කෙනෙකු අතින්ම අත්වැරදි සිදුවිය හැකිය. නමුත් තමන් ඇසුරුකරන්නෙකුට කල්තියාම තමාට නොපෙනෙන විපත් පෙනිය හැකි නිසා එවන් කෙනෙකු ගෙන් ලැබෙන උපදෙස් පිළිපැදීම ඥාණාන්විත ක්‍රියාවකි.

ඇතැම් විටක සමාජයේ ගැටුම් ඇතිවීමට දෙමාපිය අවවාදය දරුවන් නොපිළිපැදීමත්, දරුවන් කියන දේට දෙමාපියන් ප්‍රතිචාර නොදැක්වීමත්, ස්වාමියා කියනදේ භාර්යාව නොසලකාහැරීමත්, භාර්යාවගේ වචනයට ස්වාමියා කාරුණික නොවීමත්, හිතවතුන් අතර එකිනෙකාගේ බස් නොරිස්සීමත් හේතු විය හැකිය.

කුඩා කෙනෙකුගේ වුවද උපදේශය යහපත පිණිස විය හැකිය. උදාහරණයක් ලෙස වේදබ්භ ජාතකය සඳහන් කළ හැකිය. මන්ත්‍ර බලයෙන් රුවන් වැසි වැස්සවීමට සමර්ථ බමුණෙක් වීය. හේ දිනක් තම අතවැසි සමග චේතිය රට බලා නික්මුණේය. අතරමගදී ඔවුන් පැමිණියේ ඝන වනාන්තරයකටය. එහි පන්සීයක බිහිසුණු සොර මුලක් වීය. ඇදුරු බමුණා අත් අඩංගුවට ගත් සොරු, ධනය ගෙනවුත් දී ඔහු මුදාගෙන යන ලෙස අතවැසියාට කීහ. රුවන්වැසි නොවස්සන ලෙස ගරුවරයාට අවවාද දී අතවැසියා මුදල් සොයා ගමට ගිය අතර එම අවවාදය නොතකා රුවන් වැසි වැස්සවීම නිසා ගුරුවරයාගේද සොරුන් පන්සීයේද ජීවිත විනාශ විය.

මේ පද්‍යයේ එන ආකාරයට බාලයෙකු වුවත් යුක්තිසහගත යමක් කියන්නේ නම් එය පිළිගැනීමේ කිසිදු වරදක් නැත. මේ සඳහා දෙන උපමාව මෙසේය. හිරුගේ තේජස ඉතා බලවත්ය. මුළු ලොවම එළිය කිරීමට බලයක් එයට තිබුණද හිරු රැස් නොවැටෙන ස්ථානයන්ද ඇති බැවින් එවන් තැන් ආලෝකමත් කරන්නේ කුඩා පහන්ය. එමෙන්ම හිරුගේ තේජස වැනි ධන බල ආදියෙන් මහත් වුවද කුඩා අයෙකුගේ වුවත් අවවාදය යුක්ති සහගත හෝ සාධාරණ නම් එය පිළිගැනීම තමාගේ හා සමාජ ශුභ සිද්ධිය සඳහා පවතින බැවින් එය පිළිගැනීමේ වරද කිම?



♦ ***පූජ්‍ය විල්ඔය විමලජෝති හිමි***
**ලන්ඩන් බෞද්ධ විහාරය**
**London Buddhist Viharaya**

**ANOOMA & HEGODA**
**Solicitors**

**2 Queens Parade**
**Green Lanes, London N8 0RD**
**Tel. 020 8348 7772**

**Work Permits and Highly Skilled Migrant Applications done.**
**We also deal with visa refusal from British High Commission in Colombo**

Colombo Office
**Hegoda & Hegoda**
**100/6 Rosemead Place, Colombo 7**
**Tel. 2672432 / 0777686632**